Archaeological Society of Sri Lanka

# පුරාවිද්‍යා පුවත්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පුවත් හසුන

16 වෙළුම
1 කලාපය
2020
ජනවාරි-පෙබරවාරි

## තෙවැනි පුරාවිද්‍යා ඉතිහාස පර්යේෂණ සම්මන්ත්‍රණය 2020 පෙබරවාරි 15

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය සංවිධානය කරනු ලබන 'තෙවැනි පුරාවිද්‍යා-ඉතිහාස පර්යේෂණ සම්මන්ත්‍රණය' 2020 වර්ෂයේ **පෙබරවාරි මස 15 වන සෙනසුරාදා දින පෙ.ව. 8.30** කොළඹ දී පැවැත්වේ. මීට පුරාවිද්‍යාව හා ඉතිහාසය පිළිබඳ විවිධ මාතෘකා ඔස්සේ ඉදිරිපත් කෙරෙන පර්යේෂණ පත්‍රිකා ඇතුළත් වනු ඇත.

සම්මන්ත්‍රණය සඳහා සංගමය මගින් සිදු කළ පත්‍රිකා කැඳවීමට ප්‍රතිචාර ලෙස විවිධ මාතෘකා යටතේ පර්යේෂකයන් වෙතින් විස්තීර්ණ සාරාංශ 60ක් ලැබී තිබේ. ඒ අතරින් සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කිරීම සුදුසු පර්යේෂණ පත්‍රිකා තෝරා ගැනීම සඳහා පත්‍රිකා සමීක්ෂණය කිරීම මේ වන විට සිදුකෙරෙමින් පවතී. 2019 ජනවාරි මාසය අවසන් වන විට සාරාංශ සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කිරීම සඳහා පිළිගත් නොපිළිගත් බව දැනුම් දෙනු ලැබේ. ඒ අනුව සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරනු ලබන පත්‍රිකා ප්‍රමාණය තීරණය වනු ඇත.

මෙම සම්මන්ත්‍රණය මෙරට පුරාවිද්‍යාව හා ඉතිහාස විෂය හා සම්බන්ධව වැදගත් අධ්‍යයන ඉදිරිපත් කරනු ලබන සම්මන්ත්‍රණයක් වනු ඇතැයි සංගමය අපේක්ෂා කරයි.

එයට සහභාගි වන ලෙස සංගමයේ සාමාජිකයින් වෙත මෙමගින් ආරාධනා කරමු. ඒ සඳහා සහභාගි වීමට කැමැත්ත දක්වන සාමාජිකයින් සංගමයේ ජනවාරි මාසයේ පැවැත්වෙන රැස්වීමේදී අදාළ ලියාපදිංචි ගාස්තුව ගෙවා සහභාගිත්වය තහවුරු කළ යුතු බවද මෙමගින් දන්වා සිටිමු. මෙම ලියාපදිංචි වීමේ ගාස්තුවට මුද්‍රිත පත්‍රිකා එකතුව, දිවා ආහාර හා තේ පැන් ඇතුළත්ය.

- පත්‍රිකා ඉදිරිපත් කරන්නන් රු. 1200/
- සහභාගි වන්නන් සඳහා රු. 1000/

**සම්මන්ත්‍රණයට සහභාගි වීම පිළිබඳ වැඩි විස්තර සඳහා මුදිත කරුණාමුනි (071-2287497) හෝ ධනේෂ් විසුම්පෙරුම (071-4310794) අමතන්න.**

## සංවේගයෙන් දැනුම්දීමයි

**ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ හිටපු ගරු සභාපති වරයෙකු වූ මහාචාර්ය විනී විතාරණ මහතා, හිටපු ගරු භාණ්ඩාගාරික වරයෙකු වූ ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහතා සහ හිටපු විධායක සභිකයකු වූ මහාචාර්ය පී.එල්. ප්‍රේමතිලක මහතා යන සංගමයේ සම්මාන සාමාජිකයන් පසුගියදා අප අතරින් වියෝ වූ බව සාතිශය කණගාටුවෙන් යුතුව දන්වනු කැමැත්තෙමු.**

## මාසික වැඩසටහන්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ මාසික වැඩසටහන් මාලාව යටතේ මීළඟ මාස හතර ඇතුළත පැවැත්වීමට නියමිත වැඩසටහන් මෙසේය.

- **ජනවාරි 12 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව: **ශ්‍රී ලංකාවේ රහස්‍ය උමං**

  දේශක: **චාමිකර පිලපිටිය මහතා, ස්වාධීන පර්යේෂක**

- **පෙබරවාරි 09 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව: **කතෝලික ජන වන්දනාව: පසන් ගායන සම්ප්‍රදාය හා එහි වැදගත්කම**

  දේශක: **ආචාර්ය ඉරංගා සමින්දනී වීරක්කොඩි මහත්මිය**

- මාර්තු මාසයේදී පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ විස්තර පසුව දැනුම් දෙනු ලැබේ.

**සංගමයේ සාමාන්‍ය සාමාජිකයන්ට කරනු ලබන විශේෂ දැනම් දීමයි**

**2019 වර්ෂය සඳහා සාමාජිකත්වය අලුත්කර නොගත් සාමාන්‍ය සාමාජිකයින් තම සාමාජිකත්වය අලුත් කර ගන්නා ලෙස කාරුණිකව දැනුම් දෙන අතර එසේ සාමාජිකත්වය අලුත් නොකරන සාමාජිකයින්ගේ සාමාජිකත්වය අහෝසි වෙන බවද දැනුම් දෙමු.**

ඉහත දේශන කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 96 දරණ තැන පිහිටි රාජකීය ආසියාතික සමිතියේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. (මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ලේ පළමු මහලේ)

- දේශන පැවැත්වෙන දිනවල ප.ව. 1.00ට සංගමයේ විධායක සභා රැස්වීම පැවැත්වේ. ඒ සඳහා ගරු විධායක සභිකයින්ගේ පැමිණීම අපේක්ෂා කරමු.

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ලිපිනය හා දුරකථන අංක


ලිපිනය - සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

විද්‍යුත් තැපැල -
**archaeology.org.lk@gmail.com**
වෙබ් අඩවිය -
**www.archaeology.org.lk**

- ගරු සභාපති
  මහින්ද පී. මලලසේකර 072-3322411
- ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති
  ආචාර්ය කාවන් රත්නතුංග 071-7072020
- ගරු උප සභාපති
  නිතීඥ ජිමී මාරම්බේ 071-1190727
- ගරු ප්‍රධාන ලේකම්
  මුදිත කරුණාමුනි 071-2287497
- ගරු සහකාර ලේකම්
  යොහාන් පෙරෙයිරා 077-9651201
- ගරු සම්බන්ධීකරණ ලේකම්
  සංජීවනී විද්‍යාරත්න 071-5872591
- ගරු භාණ්ඩාගාරික
  ලක්ෂ්මන් රත්නායක 077-7985543
- ගරු සංස්කාරක
  රුක්ෂිලා වෙත්තමුණි 071-2097055


## නිවේදන

- සාමාජික අයදුම්පත් සංගමයේ වෙබ් අඩවියෙන් PDF ලේඛනයක් ලෙස බාගත කළ (download) හැකිය.
- අපගේ Google කණ්ඩායමේ ඊමේල් පණිවුඩ නොලැබේද? එසේ නම් ඔබේ නම, ලිපිනය හා සාමාජික අංකය සඳහන් කළ SMS පණිවුඩයක් **ගරු සහාකාර ලේකම් යොහාන් පෙරෙයිරා වෙත 077-9651201** අංකයට යොමු කරන්න.

**පුරාවිදූ පුවත් සංස්කරණය**
**රුක්ෂිලා වෙත්තමුණි**
**ගරු සංස්කාරක**
**rukshilawettamuni@gmail.com**

# සංගමයේ නිවේදන

<u>සංගමයේ අරමුදල වෙනුවෙන් මූල්‍යමය පරිත්‍යාග</u>

පුරාවිද්‍යා සංගමය ස්වේච්ඡා සංවිධානයක් වන බැවින් එහි පැවැත්ම උදෙසා ඔබට හැකි අයුරින් මුදලින් පරිත්‍යාග කළ හැකිය. ඔබගේ පරිත්‍යාග මත සංගමයේ කටයුතු විධිමත් ලෙස සංවිධානය කිරීමට අපට හැකි බව කාරුණිකව දන්වමි.

ඔබේ පරිත්‍යාග සංගමයේ රැස්වීම්වලදී මුදලින් ලබාදිය හැකිය.

බැංකුගත කරන්නේ නම් පහත දැක්වෙන සංගමයේ ජංගම ගිණුමට බැරකර බැංකු ආකෘතිපත්‍රය ඔබගේ නම සඳහන් කර අපගේ **archaeology.org.lk@gmail.com** ලිපිනයට ඊමේල් කිරීමට හෝ පැමිණ ලබාදීමට හැකිය.

**ගිණුම් අංකය - 014-1-001-1-0112875**

**ගිණුමේ නම - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය**
**Archaeological Society of Sri Lanka**

**බැංකුව - මහජන බැංකුව, යූනියන් පෙදෙස ශාඛාව**
**(Peoples Bank, Union Place Branch)**

### අලෙවිය සඳහා ඇති සංගමයේ ප්‍රකාශන

**ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය 1966-2016: පණස් වසරක ඉතිහාසය -**
මිල රු .300 (සාමාන්‍ය මිල රු .350)

**ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා**
- වෙළුම 7 (2017) - රු. 200 (සාමාන්‍ය මිල රු. 250)
- වෙළුම 6 (2016) - රු. 200 (සාමාන්‍ය මිල රු. 250)
- වෙළුම 3 (2008) - රු. 120 (සාමාන්‍ය මිල රු. 170)
- වෙළුම 2 (2006) - රු. 120 (සාමාන්‍ය මිල රු. 150)

**වෙනත්**
- සංගමයේ ස්වර්ණජයන්ති සමරු මුද්දර කවරය - රු. 50
- සංගමයේ ස්වර්ණජයන්ති සමරු මුද්දරය - රු. 15


**පුරාවිදූ පුවත්** - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකත්වය වෙනුවෙන් පළකෙරෙන පුවත් හසුනයි.



**ආපසු:**
සංජීවනී විද්‍යාරත්න
සම්බන්ධීකරණ ලේකම් - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.